# වෙස්ට්බෝර්ග්ගේ පුනරාගමනය

මෙරට නෝර්වේ තානාපති ලෙස කලක් ක්‍රියා කළ වෙස්ට්බෝර්ග් නැවතත් ලංකාවට පැමිණීමට නියමිතය. මෙවර ඔහු පැමිණෙන්නේ ඊනියා සාම ක්‍රියාවලිය සඳහා නෝර්වේ රටෙන් පත් කෙරෙන විශේෂ තානාපති ලෙසය. මේ විශේෂ තානාපතිවරුන්ගේ කාර්යභාරය පැහැදිළි නැත. එබැවින්ම විශේෂ තානාපතිවරු ගැන සැකයෙන් බැලීමට සිදුවෙයි. විශේෂ තානාපතිවරුන් පත්කිරීමෙන්ම තවත් ප්‍රශ්න මතුවෙයි.

වෙස්ට්බෝර්ග් කලක් මෙරට රෙඩ් බානා නම් රාජ්‍ය නොවන සංවිධානයේ ප්‍රධානියාව සිටියේය. ඔහු ඒ පදවිය දරණ සමයෙහි වතු කම්කරුවන්ව සිටි දෙමළ ජනයා වවුනියාව හා ඒ අවට පදිංචි කළේය. වතුකරයේ වාසය කළ දෙමළ ජනයා ඉතා විශාල වශයෙන් පදිංචි කෙරුණේ වවුනියාව හා ඒ අවට ප්‍රදේශ වලය. ඉන් පසු ඔහු ලංකාවේ නෝර්වේ තානාපති ලෙස කටයුතු කළේය. රට පාවා දෙන ඊනියා අවබෝධතා ගිවිසුම ප්‍රභාකරන් නම් දෙමළ ජාතිවාදී මිනීමරුවා හා මෙරට ආණ්ඩුව යැයි කියා ගන්නා රාජ්‍ය නොවන ආයතනයේ අගමැති රනිල් වික්‍රමසිංහ අතර අත්සන් කෙරුණේ වෙස්ට්බෝර්ග් තානාපතිව සිටි කාලයේදීය. ඒ ගිවිසුමේ අහිතකර ප්‍රතිඵල අද වන විට රාජ්‍ය නොවන ආයතනවල නඩත්තු වන්නන් හැරුණු විට අන් අයට අවබෝධ වී ඇත.

පාවාදීමේ ගිවිසුමේ ප්‍රතිඵලයක් ලෙස ඊනියා සටන් විරාම නිරීකෂණ කමිටුවක් පත් කරන ලදී. එහි ප්‍රධානියා ලෙස කටයුතු කරන්නේ නෝර්වේ ජාතිකයෙකි. තවත් කිහිප දෙනෙක් නෝර්වේජියානු හා වෙනත් ස්කැන්ඩිනේවියානු ජාතිකයෝ වෙති. අද සටන් විරාමයක් නමින් මේ කමිටුව රටේ බලය අල්ලා ගෙන ඇත. මේ ඉල්ලීම ද ඊනියා ආණ්ඩුව ඉටු කරනු ඇත. නාවික හමුදාවේ ගමන් බිමන් ගැන තොරතුරු ලබා දෙන්න යැයි මේ කමිටුවෙන් ඉල්ලීමක් ඇත. එසේම කොටි සංවිධානයේ වානිජ නෞකාවලට උතුරු හා නැගෙනහිර පළාත් වලින් ඔබ්බෙහි පිහිටි මුහුදේ නිදහසේ සැරි සැරීමට දෙන්න යැයි ඊනියා සටන් විරාම නිරීකෂණ කමිටුවෙන් ඉල්ලීමක් වෙයි. ඊනියා ආණ්ඩුව මේ ඉල්ලීමටද වැඩිකල් නොගොස් කිසියම් වූ ආකාරයකින් එකඟ වනු ඇත.

මේ ආණ්ඩුවට ඊනියා ආණ්ඩුව යැයි කියන්නේ ඇයි දැයි ඇතැමුන්ට ප්‍රශ්නයක් වී ඇත. එයට හේතුව කලින් පැහැදිළි කෙරී ඇති නමුත් නැවතත් සඳහන් කිරීමෙහි වරදක් නැත. අද මෙරට පාලනය ගෙන යන්නේ ඇමරිකාවේ සෘජු අවශ්‍යතාවය පරිදි නෝර්වේ තානාපති හා ඊනියා සටන් විරාම නිරීකෂණ කමිටුවය. වෙස්ට්බෝර්ග් තානාපතිවරයා ව සිටි සමයෙහි ඔහු මෙරට විසූරේ හෙවත් ප්‍රතිරාජයා විය. ඇමරිකන් රාජ්‍ය දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාව ඉටු වූයේ ඔහු හරහාය. ඔහු නැවතත් පැමිණෙන්නේ ඊනියා විශේෂ තානාපති නමකින් තම පැරණි ප්‍රතිරාජ තනතුරේ වැඩ භාරගැනීමටය. මෙරට ජනතාව විසින් පත් කරගෙන ඇතැයි කියන ආණ්ඩුවට කළ හැක්කේ නෝර්වේ තානාපති හා ඊනියා සටන් විරාම නිරීකෂණ කමිටුව හරහා ඇමරිකාවට අවශ්‍ය අන්දමට කටයුතු කිරීම පමණය. සටන් විරාම නිරීකෂණ කමිටුවද නමින් පමණක් සටන් විරාම නිරීකෂණ කමිටුවක් වෙයි. එය නමින් කියැවෙන කරුණුවලට වඩා වැඩි දෙයක් කරයි. අද මෙරට නිරීකෂණය කිරීමට සටන් විරාමයක් නැත. ඇත්තේ සටන් හා එමගින් රට ජාතිය පාවාදීමකි. එබැවින් ඊනියා සටන් විරාම නිරීකෂණ කමිටුව යනු එක් අතකින් ගත් කල සටන් පාවාදීම නිරීකෂණය කිරීමේ කමිටුවකි. ඉන් කෙරෙන්නේ රටේ හමුදා අකර්මණ්‍ය කරවීම, හමුදා භටයන්ගේ මානසිකත්වය දියාරු කරවීම හා ඒ අතර කොටින්ගේ ආයුධ ශක්තිය හා අනෙක් සටන් ශක්තීන් වැඩි කරවීම සඳහා අවශ්‍ය පසුබිම සකස් කිරීමය. ඊනියා ආණ්ඩුව යනු බටහිර රටවලින් ආධාර ලබාගෙන පවත්වාගෙන යන තවත් රාජ්‍ය නොවන සංවිධානයක් පමණකි.

බිඳුණුවැව සිද්ධිය ද මෙහිදී වැදගත් වෙයි. මේ සම්බන්ධයෙන් පොලිස් නිලධාරීන් තිදෙනකු ද ඇතුළු පස්දෙනකුට මරණ දඬුවම නියම කෙරී ඇත. මේ පිළිබඳ ඊනියා ආණ්ඩුවද ඇතුළු රාජ්‍ය නොවන සංවිධාන බොහෝ දේ කියනු ඇත. සති අන්ත පත්තර කඩමාළු සමහර විට පරණ තුවාල නැවත පෑරීමටද කටයුතු කරනු ඇත. සම්මා ජාතියේ තමන්ගේම යැයි කිව හැකි සංකල්පයක් හෝ ප්‍රවාදයක් නිර්මාණය කර නොමැති ගණනාථ ඔබේසේකර වැනි පුම්බන ලද ඊනියා බුද්ධිමතුන්ගේ කසිකබල් ලිපි හරහා දුටුගැමුණුගේ හෘදය සාකෂිය නැවතත් ප්‍රශ්න කෙරෙනු ඇත. මරණ දඬුවම නියම කෙරුණු අය තීන්දුවට විරුද්ධව අභියාචනා කරනු ඇතැයි බලාපොරොත්තු විය හැකිය. එහෙත් දඬුවම

© Prof. Nalin De Silva

නියම කිරීමෙන් පසුව පොලිස් නිලධාරීන් කළ ප්‍රකාශ අමතක කළ හැකි නොවේ. රාජකාරිය කිරීමට ගොස් තමන්ට මෙවැනි ඉරණමකට ගොදුරු වීමට සිදු වුණු බව ඔවුන්ගෙන් ප්‍රකාශ විණි. මේ නඩුව ලංකා ඉතිහාසයේ වැදගත් නඩුවක් ලෙස ඉදිරිකාලයේදී සටහන් වනු නියතය. කෙසේ වෙතත් මෙහි ජයග්‍රාහකයා රාජ්‍ය නොවන සංවිධාන හා බටහිර රාජ්‍ය වෙයි. රාජ්‍ය නොවන සංවිධාන වලට හා බටහිර රටවලට අවශ්‍ය දේ ලංකාණ්ඩුවේ හමුදාවල මානසිකත්වය දියාරු කර කඩා බිඳ දැමීමය. නඩු තීන්දුවෙන් පසු රාජකාරිය කිරීම පිළිබඳ හමුදා භටයන්ට කිහිපවරක් සිතීමට සිදුවනු ඇත. නඩුව සම්බන්ධයෙන් විනිසුරුවරුන්ට කළ හැක්කේ තමන් වෙත ඉදිරිපත් වූ සාක්ෂි අනුව තීන්දුවක් දීම පමණය. ප්‍රශ්නය වනුයේ මෙය සාමාන්‍ය නඩුවක් ලෙස නීතිපතිවරයා විසින් ඉදිරිපත් කරනු ලැබීමය.

මේ පොලිස් නිලධාරීන් ගැන කල්පනා කිරීමේදී තවත් බොහෝ දේ මතකයට ඇදී එයි. කොටි සංවිධානයට පාවා දෙනු ලැබූ පොලිස් නිලධාරීන් සිය ගණනක් ගැනද අද වනතුරු කිසිම ආණ්ඩුවක් කිසිම දෙයක් කර නැත. සියළු ආණ්ඩු කරන්නේ ඒ පොලිස් නිලධාරීන් මරා දැමූ මිනීමරු ෆැසිස්ට්වාදී ජාතිවාදී කොටි සංවිධානය සමඟ සාකච්ඡා කිරීමය. ජනතා විමුක්ති පෙරමුණේ නායකයා ද ඇතුළු බොහෝ දෙනා අත්අඩංගුවේදීම මරා දමනු ලැබූහ. පොදු පෙරමුණ 1994 දී මේ මිනී හරහා බලයට පැමිණීමට ක්‍රියා කළද ඔවුහු ඒ සම්බන්ධයෙන් කිසිවක් නොකළහ. ඔවුන්ට ඒ අවස්ථාවේදී ආධාර කළ පත්තර කඩමාළු හා රාජ්‍ය නොවන සංවිධාන ජනතා විමුක්ති පෙරමුණ වෙනුවෙන් හෙළයේ කිඹුල් කඳුළු බව පැහැදිළිය. බටලන්ද කිසිම වැඩකට ඇති විභාගයක් නොමැතිවම ඉතිහාසයට එක්වී ඇත. මාක්ස්වාදයෙන් තම ක්‍රියා සාධාරණීය කරමින් ජ.වි.පෙ. කළ කී දෑ අනුමත නොකළද මේ රටේ ඊනියා ආණ්ඩු හා ඒ ආණ්ඩුවල මෙහෙයවීමෙන් නීතිපතිවරු දෙයාකාරයකට ක්‍රියා කරන බව පැහැදිලිය. එයට ප්‍රධාන හේතුව ඇමරිකාව ප්‍රධාන බටහිර බලවේග දෙමළ ජාතිවාදය හා කොටි සංවිධානය පිටුපස සිටීමත්ය. ඒ විජාතික බලවේග ජ.වි. පෙරමුණට විරුද්ධ වීමත්ය. මෙරට කසිකබල් ආණ්ඩු ක්‍රියා කරන්නේ වෙස්ටබෝර්ග්ලාට අවශ්‍ය අන්දමටය. මාක්ස්වාදීන් ද ඇතුළු බටහිරයන් මානව අයිතිවාසිකම් හා ප්‍රජාතන්ත්‍රවාදය ගැන කියන දේ අබමල් රේණුවක ප්‍රමාණයකට හෝ නොතැකිය යුතුය. සැමදෙනකුම කතා කරන්නේ සාපේක්ෂක මානව අයිතිවාසිකම් ගැන පමණක් බව සඳහන් කළ යුතුය. බටහිරයන්ගේ මානව අයිතිවාසිකම් අවසාන වශයෙන් ඇත්තේ ඔවුන්ගේ ආර්ථික, දේශපාලන හා සංස්කෘතික අධිරාජ්‍යවාදය වෙනුවෙන් ක්‍රියා කරන්නන් වෙනුවෙන් පමණය.

නෝර්වේ හරහා ක්‍රියාත්මක වන ඇමරිකන් පාලනයේ ලංකාවේ සෘජු නියෝජිතයා මිලින්ද මොරගොඩ ලෙස හඳුනාගැනීම අපහසු නොවේ. අධි තාක්ෂණික බොරු උපක්‍රම මගින් දේශපාලනය කරන්නේ යැයි මතයක් ගොඩ නගාගෙන ඇති ඔහු මහා බුද්ධිමතකු ලෙස පෙනී සිටියි. එසේ නැතහොත් එලෙස පුම්බා ඇත. රවී කරුණානායකලා, චොක්ස්ලා ආදී පිරිස් අද පැත්තකට තල්ලු වී ඇත. මිලින්ද මොරගොඩ සුද්දන්ගේ නිර්වචනයට අනුකූල ව මහත්මයකු ලෙස පෙනී සිටියි. ඔහු පොදු පෙරමුණ හෝ කුමාරතුංග මහත්මිය හෝ විවේචනය නොකරයි. ඒ සඳහා එක්සත් ජාතික පෙරමුණට එස්. බී. දිසානායක, රාජිත සේනාරත්න වැනි අය සිටිති. ඔවුහු රවී කරුණානායකලාගේ තත්ත්වයටත් බොහෝ පහළින් සිටිති. මිලින්ද මොරගොඩ විසින් නිර්මාණය කෙරී ඇති එකම සංකල්පයක් හෝ නැති වුවද මාධ්‍ය හරහා ඔහුගේ ප්‍රතිරූපය ගොඩනංවා ඇත. ඔහු ඉදිරියේ මගේ මිතුරා වූ ජී. එල්. පීරිස් හිරු දුටු කදෝ පැණියකු බවට පත් කෙරී ඇත. ජී. එල්. පීරිස් බුද්ධිමතකු නොවූ බව කොළඹ විශ්වවිද්‍යාලයේ උප කුලපති තනතුර දරණ අවධියේද මා ප්‍රකාශ කළ විට බොහෝ දෙනා මගේ බුද්ධිය ගැන ප්‍රශ්න කළහ. එහෙත් අද ඔහු කවරකු දැයි හෙළි දරවු වී ඇත. හෙළිදරව්ව කිරීමට මිලින්ද මොරගොඩගේ ප්‍රචාරක මාධ්‍යයද දායක වී ඇත. මිලින්ද මොරගොඩගේ නමින් පොතක් පළවීම නිමිත්තෙන් මේ දිනවල මහා ඝෝෂාවක් ජනමාධ්‍යයෙන් කෙරෙයි. මේ පොත් පෙරලීම් වලින් ජනතාව මුළා නොවිය යුතුය. අද රනිල් වික්‍රමසිංහට ඇති ප්‍රධානම තර්ජනය චන්ද්‍රිකා කුමාරතුංග නොව මිලින්ද මොරගොඩය.

කොටි සංවිධානයේ වාණිජ යැයි කියා ගන්නා නැව ගැන අමුතුවෙන් කිව යුතු නොවේ. බොරු සටන් විරාම නිරීක්ෂක කමිටුවේ ඉල්ලීමට ආණ්ඩුව එකඟ වීමෙන් පසු කිසිම බාධාවකින් තොරව කොටි සංවිධානයේ නැව්වලට ආයුධ ප්‍රවාහණය කිරීමට ඉඩ සැලසෙනු ඇත. වෙස්ට්බෝර්ගේ පැමිණීමෙන් පසුව මේ ක්‍රියා තව තවත් වැඩි වනු ඇත. ඔහුට ඇත්තේ උතුර හා නැගෙනහිර පළාත් වෙන්කර කොටින්ට එහි පාලනය භාරදීමය. ඔහු අද ලංකාවේ කරන්නේ එදා මවුන්ට්බැටින් නමින් හැඳින්වෙන බ්‍රිතාන්‍ය ප්‍රතිරාජයා ඉන්දියාවේ කළ දෙයය. මවුන්ට්බැටින් ඉන්දියාව දෙකඩ කර

© Prof. Nalin De Silva

පකිස්ථානයක් නිර්මාණය කළේය. වෙස්ට්බෝර්ග්ට නියම වී ඇත්තේ ඊළම නිර්මාණය කිරීමය. ඊනියා සාම සාකච්ඡා වෙස්ට්බෝර්ග්ගේ මැදිහත් වීමෙන් ඇන්ටන් බාලසිංහම් නොව තමිල් සෙල්වන් ප්‍රධාන කරගෙන ඇරඹෙනු ඇත. එහිදී ලන්ඩන් සූත්‍රය ඉදිරියට ගෙන යනු ඇත. ලන්ඩන් සූත්‍රය යනුවෙන් මා නම් කරන්නේ රනිල් වික්‍රමසිංහ, මිලින්ද මොරගොඩ හා ජී. එල්. පීරිස් බ්‍රිතානි ආණ්ඩුවේ නියෝජිතයන් සමග ලන්ඩනයේදී ඇති කරගන්නා ලද සම්මුතියය. මේ තුන් කට්ටුව පසුගියදා තකහනියක් ලන්ඩනයට ගියේ එලිසබෙත් වින්ඩ්සර්ගේ මෞලි මංගල්‍යයේ පණස්වැනි සංවත්සරය සැමරීමට නොවේ. එසේත් නැතහොත් ඇගේ මුණුබුරා වූ විලියම් වින්ඩ්ස්ර්ගේ විසි එක් වැනි ජන්ම දිනය වෙනුවෙන්ද නොවේ. ඔවුන්ට එහිදී ලන්ඩන් සූත්‍රය ක්‍රියාත්මක කිරීමට උපදෙස් ලැබුණි.

ඒ අනුව ඊනියා සාම සාකච්ඡා වෙස්ට්බෝර්ග්ගේ මෙහෙයවීමෙන් නැවත ආරම්භ වෙයි. එහිදී කොටින්ට උතුරු නැගෙනහිර පළාත් දීමට අවශ්‍ය පියවර ගැනෙයි. එය මුලදී අන්තර්පාලනය විය හැකිය. නැතහොත් වෙනත් වරප්‍රසාද විය හැකිය. නාවික හමුදාව අකර්මණ්‍ය කිරීම මෙහි ප්‍රධාන අංගයක් වනු ඇත. අද කොටි සංවිධානයට ප්‍රධානම ප්‍රශ්නය වී ඇත්තේ නාවික හමුදාවය. උතුරු හා නැගෙනහිර පළාත් වලින් හමුදා ඉවත් කිරීම, අත්අඩංගුවේ පසුවන කොටි ත්‍රස්තවාදීන් නිදහස් කරගැනීම පමණක් නොව කොටින්ට උතුර හා නැගෙනහිර පළාත් වලින් පිටද කඳවුරු පවත්වාගෙන යෑමේ නිදහස හා ක්‍රියාත්මක වීමේ අයිතියද එහිදී වැදගත් වන අනෙක් කරුණුය. දැනටමත් කොටි පොළොන්නරුව දිස්ත්‍රික්කයේ කඳවුරක් පිහිටුවා ඇත. ඔවුහු එය ඉවත් කරගැනීම් ප්‍රතික්ෂේප කරති. ඒ අතර ඔවුන් හමුදා බුද්ධි අංශවල සේවය කළවුන් දිගින් දිගටම ඝාතනය කරන්නේ එය තමන්ගේ අයිතියක් ලෙස සලකමිනි. පසුගියදා දෙහිවල ප්‍රදේශයේදී සිදු කළ ඝාතනය මේ සම්බන්ධයෙන් දිය හැකි ආසන්නම උදාහරණය වෙයි. මේ ඝාතන පරීක්ෂාකිරීමට ඊනියා සටන් විරාම නිරීක්ෂණ කමිටුව ඉල්ලයි. කොටි පිටුපස වෙස්ට්බෝර්ග්ගේ ගෝල බාලයෝ උතුරු හා නැගෙනහිර පළාත් වලින් පිටතට ද එති. මුළු ලංකාවේ ම අධිකරණය බවට ඊනියා සටන් විරාම නිරීක්ෂණ කමිටුව පත්වීමේ අවදානමක්ද වෙයි.

මෙහිදී ජනාධිපතිවරිය කිනම් පියවරක් ගන්නේද? කටින් බතල කොල සිටුවා වැඩක් නැත. අද කළ යුත්තේ වහාම ක්‍රියාමාර්ගයක් ගැනීමය. ශ්‍රී.ල.නි. පක්ෂයේ නායකත්වයේ ඇති ප්‍රශ්නය අද හෙට විසඳා නොගන්නේ නම් රටේ ස්වෛරීභාවය තර්ජනයට ලක්වෙනු ඇත. ලිබරල්වාදයෙන් හෝ මාක්ස්වාදයෙන් හෝ මේ රටට අත්වන සුගතියක් නැත. සකල විධ විජාතික බලවේග වලට විරුද්ධව ජාතික බලවේගයක් නිර්මාණය කිරීම අද අවශ්‍යතාවය බවට පත්වී ඇත. එහෙත් අවාසනාවකට ශ්‍රී ල.නි. පක්ෂයද තවමත් විජාතික බලවේගවලින් මුළුමනින්ම මිදුනේ නොවේ. මෙරට ප්‍රශ්නය අන් කිසිවක් නොව ශ්‍රී ල.නි. පක්ෂයේ ප්‍රශ්නය බව තේරුම් ගත් විට ප්‍රශ්නය විසඳීම පහසු වනු ඇත. ඒ ප්‍රශ්නය විසඳා ගන්නා තෙක් වෙස්ට්බෝර්ග් ආපසු යැවීමට නොහැකිය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva